DOI: https://doi.org/10.4038/p.v14i1.24

*PRAVACANA: The Journal of Bhiksu University of Sri Lanka, Vol. 14-Iss. I, Jun. 2023, 16-28.*

# බුද්ධ වචනය සම්බන්ධ වර්ගීකරණයන්හි ක්‍රමික විකාශය හා ශාස්ත්‍රීය පදනම

# [Gradual Evolution and Academic Foundation of the Categerization of the Buddhist Doctrine]

**Opatha Samitha**[1]

## Abstract

Centuries after the passing away of the Exalted One, his doctrine has undergone various divisions today. Yet, by studying the Early Buddhist sources, it is clear that although the Buddha generally used terms like 'Dhamma', 'Dhammacakka', 'Abhivinaya', 'Dhammavinaya', 'Navaṅgasatthusāsana' etc. to introduce his dhamma, his doctrine was not divided into baskets. In the 'Alagaddūpama Sutta' of the Majjhimanikāya, the Buddha introduced his doctrine as 'Navaṅgasatthusāsana', but it is not indicated clearly in that sutta what the dhamma points belonging to the ninefold dispensation of the teacher Accordingly, our expectation in this study is to study the historical background of different classifications of Buddha's doctrine after his demise and what is the academic basis of that division. Primary and secondary sources are expected to be used in this research, which will be studied under the qualitative research methodology. (navaṅgasatthusāsana) are. In later times, Venerable Buddhaghosa thera in his commentaries stated separately what the dhamma points belonging to the ninefold dispensation of the teacher (Navaṅgasatthusāsana), but there is no unanimity in the academic world about the division. However, the word of the Buddha is specifically divided into three baskets namely Sutta, Vinaya and Abhidhamma after the first and third Buddhist councils. That is a result of several reasons. However, it is necessary to study what is the academic basis and historical background of dividing the Buddha's words into different classifications after his demise, which was oneness during the Buddha's lifetime.

**Keywords:** Abhivinaya, Dhamma, Dhammacakka, Jinavacana, Navaṅgasatthusāsana

1 Assistance Lecturer, Department of Pali and Buddhist, University of Kelaniya, Sri Lanka.

Received: 28 April 2023, Accepted revised version: 20 June 2023.

This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

### හැඳින්වීම

තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ශ්‍රී මුඛ දේශනාව වත්මන වන විට විවිධ විභජනයන්ට බඳුන්ව ඇති බව විද්‍යමාන වන කරුණකි. මෙසේ ධර්මය කොටස් වශයෙන් බෙදී වෙන් වන්නට පෙර එනම්, බුදුරදුන් ධරමාන සමයේදී බුද්ධ දේශනාව ධම්ම, ධම්මවිනය, ධම්මචක්ක, නවංගසත්ථුසාසන, බ්‍රහ්මචරිය, සාසන, පාවචන ආදී පොදු නාමකරණයන්ගෙන් හඳුන්වා ඇති බව පෙළ ග්‍රන්ථ අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ. තෙවන ධර්ම සංගායනාවෙන් අනතුරුව සූත්‍ර, විනය, අභිධර්ම යනුවෙන් ධර්මය පැහැදිලිව බෙදී වෙන්ව තිබුණ ද බුදුරදුන් විසින්ම ස්වකීය දේශනාව හඳුන්වාදීම සඳහා යොදාගත් උක්ත ධම්ම, ධම්ම - විනයාදී නාමයන්ගෙන් නිශ්චිත බෙදා දැක්වීමක් අදහස් නොවේ. උන්වහන්සේ භාවිත කළ නාමයන්ගෙන් ධර්මයත් විනයත් පොදුවේ නියෝජනය වී ඇත. කෙසේ වෙතත් බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ප්‍රථම, දෙවන හා තෙවන සංගායනාවන්හි දී සංගීතිකාරක තෙරුන් වහන්සේලා හා අටුවාචාරී බුද්ධඝෝෂ තෙරුන් ධර්මයත් විනයත් විවිධ කරුණු මුල්කරගනිමින් බෙදා දක්වා තිබේ. ඒ අනුව බුද්ධ දේශනාව බුදුරදුන් ධරමාන සමයේ සිට මේ දක්වා වර්ගීකරණයට ලක්වීමේ ඓතිහාසිකමය හා ශාස්ත්‍රීයමය පදනම සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කිරීම උචිත ය.

### සාහිත්‍ය විමර්ශනය

බුද්ධ වචනය සම්බන්ධ වර්ගීකරණයන්හි ඓතිහාසිකත්වය හා එහි ක්‍රමික විකාශය පිළිබඳ විමසීමට ලක්කෙරෙන මෙම අධ්‍යයනයේදී ඒ ආශ්‍රිතව සිදු කර ඇති පූර්ව අධ්‍යයනයන් කවරක් ද යන්න සොයා බැලිණි.

ජෝන් රෝස් කාර්ටර් (Jhon Ross Carter) "The Traditional definitions of the term Dhamma" (1976) නම් කෘතියෙහි බුද්ධ දේශනාව හැඳින්වීම සඳහා පොදුවේ යොදාගෙන ඇති වචන සම්බන්ධයෙන් ගැඹුරු විවරණයක යෙදේ. එහිදී ඔහු පාලි සූත්‍ර දේශනා හා තදට්ඨකථාවන් යොදාගනිමින් ධම්ම, ධම්මවිනය, ධම්මචක්ක ආදී වචනයන්හි භාවිත ධර්මාර්ථයන් හා එම වචන ත්‍රිපිටකයෙහි යෙදී ඇති ස්ථාන පිළිබඳව පැහැදිලි කර ඇත. මහාචාර්ය ඔලිවර් අබේනායක විසින් රචනා කරන ලද "ත්‍රිපිටක සාහිත්‍ය ඉතිහාසය; විනය පිටකය" (1983) නම් කෘතියෙහි විනය හා අභිවිනය සම්බන්ධයෙන් කරන ලද පැහැදිලි කිරීමක් හමුවේ. එහිදී එතුමා විනය හා අභිවිනය යන්න නිකාය ග්‍රන්ථ තුළ යෙදී ඇති අවස්ථා හා ඉන් ප්‍රකාශවන අර්ථ කුමක් ද යන්න සියුම්ව විග්‍රහ කර තිබේ. පැලැන්වත්තේ ධම්මතිලක හිමියන් "ධම්ම සංකල්පයේ දේශපාලන ආර්ථික සමාජභාවිතය" (2003) කෘතිය තුළ ධම්ම සංකල්පය පෙළ සාහිත්‍යයෙහි භාවිතවී ඇති ආකාරය හා ඉන් ප්‍රකාශිත ධර්මාර්ථයන් කවරක් ද යන්න ගැඹුරින් පැහැදිලි කර ඇත. මහාචාර්ය ඔලිවර් අබේනායක "පාලි අධ්‍යයන විමර්ශන" (2009) කෘතියෙහි නවංගසත්ථුසාසන වර්ගීකරණය සම්බන්ධයෙන් කරුණු දක්වා තිබේ. තත් කෘතියෙහි ඔහුගේ පැහැදිලි කිරීමට අනුව නවංගය පිළිබඳ බුද්ධඝෝෂ තෙරුන්ගේ බෙදාදැක්වීම ගැටලු සහගතය. නවංග සත්ථුසාසනය සම්බන්ධයෙන් මහාචාර්ය වැගම පියතන හිමියන් "ශාස්ත්‍රීය ලිපි සරණිය" (2014) කෘතිය තුළ විචාරාත්මක අධ්‍යයනයක යෙදී ඇත. එහිදී උන්වහන්සේ බුද්ධඝෝෂ තෙරුන් ස්වකීය අටුවා තුළ අංග නවයට අයත් ධර්ම කොටස් බෙදා දැක්වීමේ ගැටලු කිහිපයක් පෙන්වා දෙමින් එම බෙදා දැක්වීම දෝෂ සහිත වූවක් බව කියා සිටී. බොරුල්ලේ කෝවිද හිමි හා චරිත් වීරසිංහ විසින් සංස්කරණය කරන ලද "මුල් බුදුසමයාගත නවංගසත්ථුසාසනය" (2017) සඟරාවෙහි නවංග වර්ගීකරණය සම්බන්ධයෙන් කතුවරුන් කිහිපදෙනෙකු විසින් රචිත ලිපි අන්තර්ගත ව ඇත. එම එක්

එක් ලිපිය තුළ නවංගසත්ථුසාසනයට අයත් ධර්ම කොට්ඨාස හා එම බෙදාදැක්වීමේ ශාස්ත්‍රීය පදනම වෙන වෙනම පැහැදිලි කොට තිබේ.

**පර්යේෂණ ගැටලුව**

බුද්ධ වචනය සම්බන්ධයෙන් පශ්චාද් කාලීන වර්ගීකරණයන්හී ශාස්ත්‍රීය පදනම කුමක් ද යන්න අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුවයි.

**පර්යේෂණ අරමුණ**

සියවස් ගණනාවක් පුරාවට බුද්ධ දේශනාව විවිධ වර්ගීකරණයන්ට ලක්ව ඇති ආකාරය අධ්‍යයනය කොට එම වර්ගීකරණයන්හි ශාස්ත්‍රීය පදනම කුමක් ද යන්න හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණයි.

**පර්යේෂණයේ වැදගත්කම**

බුද්ධ වචනය වර්ගීකරණයෙහි ක්‍රමික විකාශය හා එහි ශාස්ත්‍රීය පදනම සම්බන්ධයෙන් කරුණු සංග්‍රහ කිරීම සිදුව ඇත්තේ අල්ප වශයෙනි. විශේෂයෙන් නවංගසත්ථුසාසනයෙහි ශාස්ත්‍රීය පදනම පිළිබඳ ව උගතුන් කිහිපදෙනෙකු කරුණු සාකච්ඡා කර තිබුණ ද බුදුරදුන් ධරමාන සමයේ ධර්මය හැඳින්වීම සඳහා යොදාගත් වචන පිළිබඳ ව මෙන්ම පශ්චාද්කාලීනව සිදු වූ වර්ගීකරණයන්හි ශාස්ත්‍රීය පදනම සම්බන්ධයෙන් එක් ස්ථානයක් තුළ කරුණු සංග්‍රහවී නොමැත. එබැවින් මෙම අධ්‍යයනය මඟින් බුද්ධ වචනය ක්‍රමික ව වර්ගීකරණය වූයේ කෙසේ ද යන්නත් එහි ශාස්ත්‍රීය පදනම කුමක් ද යන්නත් යම් පමණකට හඳුනාගත හැකි ය.

**ධම්ම**

පෙළ සාහිත්‍යයේ බහුලව හමුවන ධම්ම යන්න ධාරණාර්ථවාචී ධර ප්‍රත්‍යයෙන් පරව නිර්මාණය වී ඇත. බහුවිධ අර්ථයන් ජනනය කරන මෙම පදය ඒ ඒ අවස්ථාවට අනුකූලව වටහා ගැනීම සාතිශය වැදගත් වූවකි. මේ පිළිබඳ අදහස් දක්වන පාලි ශබ්දකෝෂය විවිධ අවස්ථාවන්හි භාවිත වන ස්වරූපය අනුව මේ සඳහා අර්ථ කිහිපයක් ලබා දේ.

i. Applied to good conduct - ගුණ

ii. To preaching and moral - දේසනා

iii. To the 9-fold collection of the Buddha - නවංගසත්ථුසාසන

iv. To cosmic law - ලෝක නීතිය

v. Wisdom - බුද්ධිය

vi. As 6 sense object - ෂඩේන්ද්‍රිය

vii. 5 Nikayas - නිකාය පහ

ධම්ම යන්නෙන් දරන්නා, සංයුතිය, (යම් දෙයක ස්වභාවය) නියමය, රීතිය, යුක්තිසහගතභාවය, ගුණය, මනසේ අරමුණ, ඉන්ද්‍රිය ගෝචර වස්තුව (Phenomenon) යන සුවිශේෂ අරුත් ද ලබා දේ. මීට අමතරව තථාගතයන් වහන්සේ විසින් සොයාගනු ලැබුවාවූත්, දේශනා කරනු ලැබුවාවූත් විමුක්තිදායක මාර්ගය වූ චතුරාර්ය සත්‍යය තුළ 'ධම්ම' යන්න ගැබ්ව ඇත. මේ පිළිබඳ වසර ගණනාවක් පර්යේෂණ කරන ලද පෙරා'පරදිග විද්වතුන් විවිධ අදහස් ඉදිරිපත් කර ඇති නමුත් නිශ්චිත නිගමනයකට එළඹීමට තවමත් අපොහොසත් වී ඇත. එම විද්වත් පිරිස් අතුරින් රීස් ඩේවිඩ් මහත්මිය (Miss Rhys David) දක්වන අන්දමට " 'ධම්ම' යනු ලොව සියල්ල පාලනය කරනු ලබන දෙවියෙකු නොවේ. සැබැවින්ම එය මාර්ගය (Tao), අවශ්‍ය දෙය (Anayke), යහපත (Agathon, Plato's Good) යන අර්ථයන් ජනනය කරන, මානව බුද්ධිය දැරූ උපරිම ප්‍රයත්නයන් රැසක් නියෝජනය කරන්නකි." ඊ. ජේ. තෝමස් (E. J. Thomas) දක්වන අන්දමට ධම්ම යන්නෙහි "කෙනෙකු තම ජීවිතය හැඩගස්වා ගැනීම සඳහා යොදාගන්නා මූල සිද්ධාන්ත" ගැබ්ව ඇත. හෙලේනා විල්මොන් ග්‍රැබොස්කා (Helena

Willman Grabowska) වෛදික යුගයට අයත් ග්‍රන්ථාවලියේ සිට මහායාන චින්තාව තෙක් යථෝක්ත පදයේ අර්ථය විකාශනය අධ්‍යයනය කර මෙවන් අදහසක් ඉදිරිපත් කර තිබේ. "භාෂාවේ සෞකාර්යය සඳහා වචනවල නිර්නිත අර්ථයක් තිබීම සෑම විටම අවශ්‍ය වූවක් නොවේ. එපමණ නිර්නිත නොමැති වූ වචනවලින් ද සේවාවක් ඉටු කළ හැකි ය. එය අඩක් පිරූ අච්චුවක් වැන්න. එක් එක්කෙනාට රුචි පරිදි එය පිරවිය හැකි ය. එහෙත් ප්‍රථමයෙන් එහි අඩංගු වූ දෑ එහි මුළු ප්‍රමාණය මෙන් වෙයි. එහි රසය මුළු මිශ්‍රණයටම ලබා දේ. ධර්ම යන වචනයේ රසය එනම්, සමය හෝ ස්වභාවය ධර්මය විසින් පනවන ලද (එය) වෙනම යළි පැමිණෙන්නා වූ යුක්ති ධර්මය පිළිබඳ හැඟීම, කිසිවක් මත රඳා නොපවත්නා වූ ස්ථිරත්වය පිළිබඳ අදහස එහි ප්‍රභවය වශයෙන් මිනිසා විසින් නිර්මාණය කරන ලද්දකි. මෙම දළ අදහසට පරිබාහිරව අභ්‍යන්තරානුරූප පරිදි ධර්ම යන වචනයට තවද සෑහෙන තරමක් විශේෂ අර්ථ අගයක් ආරෝපණය කළ හැකි ය." මේ අනුව පෙනී යන්නේ බොහෝ විද්වත් පිරිසක් තත් වචනය පිළිබඳ විවිධ අදහස් දක්වා තිබුණ ද එමඟින් නිශ්චිත අරුතක් සොයාගත නො හැකි බවයි.

ත්‍රිපිටක ග්‍රන්ථාවලියේ හා තදන්‍ය අටුවා ග්‍රන්ථයන්හි සුලබව හමුවන 'ධම්ම' යන පදය සඳහා විවිධ අරුත් යොදාගෙන ඇත. මජ්ඣිම නිකායට්ඨකථාවෙහි "භික්ෂුව සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ ආදී ධර්මයන් පුහුණු කරයි" යන තන්හි ධර්මය පර්යාප්ති, ප්‍රතිවේද, ප්‍රතිපත්ති ලෙස හඳුන්වා ඇත. සුමංගලවිලාසිනී හා ධම්මපදට්ඨකථාවට අනුව 'ධම්ම' යන්නෙන් අරුත් හතරක් ජනනය වේ. එනම්,

i. ගුණ - ශීලාචාර ධර්ම

ii. දේශනා - ඉගැන්වීම්

iii. පරියත්ති - ශ්‍රී මුඛ දේශනාව

iv. නිස්සත්ත - ජීව පදාර්ථ නැත යනුවෙනි.

ථෙරවාදය තුළ ධම්ම යන්න විස්තර කිරීමේදී 'සංඛත ධම්ම' නාම-රූප වශයෙන් දක්වයි. ලෝකයේ නිත්‍ය වශයෙන් ගත හැකි සත්ත්වයෙකු හෝ පුද්ගලයෙකු නොමැති හෙයින් නිත්‍ය වූ අවිපරිණාමී කිසිවක් නැතැයි යන්න වටහා දීම සඳහා නාම රූප විග්‍රහය යොදාගෙන ඇත. එම විග්‍රහයට අනුව අප සම්මුතිය තුළ වටහාගන්නා සත්ත්වයා යන්න විශ්ලේෂණාත්මකව බුදුරදුන් දක්වා ඇති අන්දම පහත දැක්වේ.

i. පඤ්චස්කන්ධ විභාගය (රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ)

ii. ෂඩ් ධාතු විභාගය (පඨවි, ආපො, තෙජො, වායො, ආකාස, විඤ්ඤාණ)

iii. ද්වාදස ආයතන විභාගය

චක්ඛු - රූප

සොත - සද්ද

ඝාණ - ගන්ධ

ජිව්හා - රස

කාය - ස්පර්ශ

මන - ධම්ම

iv. අට්ඨාරස ධාතු විභාගය

චක්ඛු ධාතු රූප ධාතු චක්ඛු විඤ්ඤාණ ධාතු

සොත ධාතු සද්ද ධාතු සොත විඤ්ඤාණ ධාතු

ඝාණ ධාතු ගන්ධ ධාතු ඝාණ විඤ්ඤාණ ධාතු

ජිව්හා ධාතු රස ධාතු ජිව්හා විඤ්ඤාණ ධාතු

කාය ධාතු, ඵස්ස ධාතු, කාය විඤ්ඤාණ ධාතු,

මන ධාතු, ධම්ම ධාතු, මනො, විඤ්ඤාණ ධාතු.

උක්ත විභජනය බුදුරදුන් 'සබ්බ' යන පොදු ව්‍යවහාරයෙන් හඳුන්වා ඇත. "මහණෙනි, මම සියල්ල දෙසමි. එය අසව්. මහණෙනි, සියල්ල යනු කිම යත්, ඇසය, රූපය ය, කණ ය, ශබ්දය ය, නාසය ය, ගන්ධය ය, මන ය, ධම්ම ය. මහණෙනි, මේ සියල්ල යැයි කියනු ලැබේ." මේ අනුව ථෙරවාද ධම්ම යන්නෙහි මූලික අභිප්‍රාය වී ඇත්තේ සත්ත්ව, පුද්ගල වශයෙන් කිසිවක් නිශ්චිතව ගත නොහැකි හෙයින් මෙන්ම සියල්ල හේතුඵලවාදී ව සිදුවන හෙයින් සංස්ලේෂණ හා විශ්ලේෂණාත්මක ක්‍රමවේදයක් යටතේ කරුණු විස්තර කර දැක්වීම ය.

**ධම්ම-විනය**

බුද්ධ වචනය පශ්චාත් කාලීනව විවිධ වර්ගීකරණයන් යටතේ හැඳින්වුව ද ධම්ම විනය යන වර්ග කිරීම තරම් ඒ කිසිවක් ඉපැරණි නොවේ. තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද සමස්ත බුද්ධ භාෂිතයම අයත් කළ හැකි එකම වර්ග කිරීම වන්නේ ද මෙය ය. මජ්ඣිමනිකායට අයත් අලගද්දූපම සූත්‍රයෙහිදී ධර්මය කොටස් නවයක් ලෙස හඳුන්වා දී තිබුණ ද සමස්ත බුද්ධ දේශනාවම ඒ සඳහා ඇතුළත් ව ඇති බවක් නොපෙනේ. මන්ද විනය දේශනා හෙවත් ආණා දේශනා නවංගසත්ථුසාසනයේ කිනම් කොටසකට අයත් ද යන්න නිශ්චිතව දක්වා නො තිබීමයි. ඒ අනුව සමස්ත බුද්ධ වචනයම ඇතුළත් වන පරිදි බෙදා වෙන් කරන ලද සාර්ථක වූත් පෞරාණික වූත් වර්ගීකරණය වශයෙන් ධම්ම - විනය යන්න සකාරණව පිළිගත හැකි ය.

ප්‍රථමාභිසම්බුද්ධ යුගය දක්වාම ධම්ම-විනය යන ව්‍යවහාරය ධර්මයත් විනයත් පොදුවේ හැඳින්වීම සඳහා භාවිත විය. එහිදී ධර්මයට ප්‍රමුඛත්වයක් ලැබුණු අතර විනය ධර්මය තුළ සංග්‍රහව පැවතුණි. විනය ධර්මයෙන් පරිබාහිර වූ වෙනම කොටසක් වශයෙන් හඳුන්වන්නට යෙදුණේ මුල් බුදු විසිවසෙන් අනතුරුව ය. ඊට පෙර එනම්, බුද්ධත්වයෙන් ගතවූ මුල් වසර විස්ස තුළ විනය යන්න අප වර්තමානයේ හඳුන්වන බැඳීරුම් හා පුළුල් අර්ථයෙන් නො යෙදී හුදු ධර්මමය අර්ථයෙන් පමණක් යෙදී ඇත. මීට අමතරව ධම්ම - විනය යන්න සූත්‍ර පිටකය තුළ ඇතැම් අවස්ථාවන්හි සමාන අර්ථයෙන් ද ඇතැම් අවස්ථාවන්හි වෙනස් අර්ථයෙන් ද හඳුන්වා ඇත. වරක් බුදුරදුන් සුදින්න භික්ෂුව අරබයා දේශනා කළ "යො අහං එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිත්වා නාසක්කිං යාවජීවං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරිතුං" යන දේශනාව විනය ශික්ෂා පැනවීමට පෙර කරන ලද දේශනාවක් හෙයින් එහි කියවෙන ධම්ම විනය යන්නෙන් ප්‍රඥප්ති විනය අර්ථවත් නො වේ. හුදෙක් එය බුද්ධ වචනය යන අර්ථයෙන් පමණක් යෙදේ. ධම්ම විනය යන්න බුදු සමයට පමණක් විශේෂ වූවක් වීම සුවිශේෂ කරුණකි. වරක් බෝසතාණන් වහන්සේ බුද්ධත්වය සොයා යන ගමනේදී හමු වූ ආලාරකාලාම, උද්දකරාමපුත්ත යන ආචාර්යවරුන් දෙපළ හමුවේ ඔවුන්ගේ ධර්ම විනයේ හා බ්‍රහ්මචර්යාවේ යෙදීමට කැමැත්තක් පළකිරීමෙන් ඒ බව වඩාත් තහවුරු වේ.

ඇතැම් අවස්ථාවන්හි බුදුරදුන් සදාචාරාත්මක වශයෙන් හික්මිය යුතු කාරණා සූත්‍ර පිටකය තුළ දේශනා කර තිබුණ ද එකී දේශනා ආණා දේශනාවල දැකගත හැකි විධානාර්ථයක් හෝ බ්‍රහ්මචර්යාවේ බලකිරීමක් වශයෙන් යෙදී නොමැත. එවැනි කාරණා යෙදී ඇත්තේ අනුශාසනා හා උපදේශාත්මක ස්වරූපයෙන් පමණි. නිදසුනක් වශයෙන් සොරකම් කිරීම ගත් කල්හි එය විනයට අනුව සාතිශය බරපතළ වරදකි. එය උපසපන් භික්ෂුවගේ පැවිද්ද පවා අහෝසි වී යන පාරාජිකාවකට ද අයත් ය. නමුත් ධර්මයෙහි සොරකම විනයෙහි ඉදිරිපත් වන ආකාරය මෙන්

බරපතළ වරදක් ලෙස අර්ථගන්වා නොමැත. එය හුදෙක් ධර්මයෙහි පෞද්ගලික ආධ්‍යාත්මිකත්වයට බලපාන්නක් වශයෙන් සලකා සොරකම් නොකර සිටීමේ ආනිසංස පමණක් දක්වා තිබේ. වරක් බුදුරදුන් භික්ෂූන් අමතා තමන් වහන්සේ එකාංස භෝජනයෙන් යුක්ත වන බවත් එමගින් බොහෝ රෝගාබාධයන්ගෙන් මිදීමට හා බ්‍රහ්මචර්යාවේ යෙදීමට ඇති හැකියාව පෙන්වා දේ. නමුත් බුදුරදුන් එහිදී සියලු භික්ෂූන් තමන් වහන්සේ මෙන් ඒකාංස භෝජනයෙන් යුක්ත විය යුතු බවට පැනවීමක් හෝ ඉල්ලීමක් නොකරන ලදී.

භික්ෂු ප්‍රතිපදාව වඩාත් ශක්තිමත් හා ප්‍රතිඵලදායක එකක් බවට පත්කර ගැනීම සඳහා බුදුරදුන් උපදේශාත්මකව කළ දේශනාවක් සුත්ත නිපාතයේ හමුවන අතර තත් දේශනාවේ ඇතුළත් කරුණු ප්‍රාතිමෝක්ෂයේ ඉදිරිපත් වන ආඥා දේශනාවල මුල් අවස්ථාවක් වශයෙන් සැලකිය හැකි ය. එහි ඇතුළත් පද හා පාඨ මෙන්ම අර්ථයන් ද මුල් බුදුවිසිවසෙන් පසුව එක්වූ විනය ශික්ෂාවන් සමග බෙහෙවින් සැසඳේ. විශේෂයෙන් සේඛියා හා පාචිත්තිය ඒ අතුරින් මුල් තැනක් ගනී. සුත්ත නිපාතයෙහිම ඇතුළත් තවත් කෙටි සූත්‍රයක් වන ධම්මික සූත්‍රයේ ද විධාන හා ප්‍රතිෂේධාත්මක ස්වරූපයෙන් යුත් කරුණු කිහිපයක් සාකච්ඡා වී තිබේ. එය විනය ශික්ෂාවන්හි පරමාර්ථය සංක්ෂිප්තව ඉදිරිපත් කිරීමක් වැනි ය.

සූත්‍ර පිටකාගත උපදේශාත්මක ධර්ම කරුණු පසුකාලීනව ශික්ෂාපද වශයෙන් විනය පිටකයට එක්ව ඇති බව ප්‍රාතිමෝක්ෂය අධ්‍යයනය කිරීමෙන් ප්‍රකාශ වේ. එහි පාරාජිකා උද්දේසයේ "ඇවැත්නි, නිදානය ද, සතර පාරාජිකා ධර්මයෝ ද උදෙසන ලදී. ඇවැත්නි, ඔබ විසින් තෙළෙස් සංඝාදිසේස ධර්මයෝ ද, අනියත ධර්මයෝ දෙදෙන ද, තිසක් නිස්සග්ගිය පාචිත්තිය ධර්මයෝ ද, දෙයානූවක් පාචිත්තිය ධර්මයෝ ද, පාටිදේසනීය ධර්මයෝ සතර දෙන ද, සේඛියා 75 ක් ද, අධිකරණ ධර්මයෝ සත ද අසන ලද්දාහු ය. සූත්‍රාගත වූ සූත්‍ර පර්යාපන්න වූ (සුත්තාගතං, සුත්තපරියාපන්නං) මෙතෙක් ධර්මයන් උදෙසීම සඳහා භික්ෂූන් සියල්ලම සමගිව සතුටු සාමීචි කථාවෙන් යුතුව විවාද නොකොට හික්ම විය යුතු ය." යනුවෙන් සඳහන් මෙම පාඨයේ " සුත්තාගතං, සුත්තපරියාපන්නං" යන්නෙන් ශික්ෂාපද සියල්ල සූත්‍ර මූලික කරගනිමින් ප්‍රාතිමෝක්ෂයට එක්ව ඇති බව තහවුරු කරගත හැකි ය. ඒ අනුව මුල් බුදුවිසිවසෙහි ධර්මයත් විනයත් ඒකදේශයක්ව පැවති බවත් එය ප්‍රථම ධර්ම සංගායනාවෙන් පසුව සූත්‍ර හා විනය වශයෙන් පිටකද්වයකට බෙදීගිය බවත් පැහැදිලි ය.

**ධම්මචක්ක**

බුද්ධ වචනය හැඳින්වීම සඳහා යොදාගත් තවත් වචනයකි ධම්මචක්ක යන්න. තත් වචනය පිළිබඳ අර්ථ විග්‍රහයක යෙදෙන බෞද්ධ ශබ්දකෝෂය දක්වා තිබෙන්නේ "ධර්ම චක්‍රය යනු බුදුන් වහන්සේ විසින් පෙරළා යැවූ (දිගටම පවත්නා පරිදි ස්ථාපනය කළ) ධර්මය යි. එනම් චතුරාර්ය සත්‍යය යි." යනුවෙනි. මෙම අදහසට සමාන අදහසක් ඉදිරිපත් කරන පාලි-සිංහල අකාරාදිය "චක්‍රයක් මෙන් යෙදූ ධර්මය" ලෙස ධර්මචක්‍ර යන්න විස්තර කර ඇත. මේ අනුව තථාගතයන් වහන්සේගේ පළමු ධර්ම දේශනාව වන ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනාවෙහි ප්‍රධාන කාරණාව චතුරාර්ය සත්‍යය වෙත යොමු කර ඇති නිසා ධම්මචක්ක යන්නෙන් චතුරාර්ය සත්‍යය හඳුන්වාදීමට යොදාගෙන ඇති බව පෙනේ. අටුවාව දක්වන අන්දමට ධම්මචක්ක යන්නෙන් දෙවැදෑරුම් අර්ථ ජනනය කරයි. එනම්, පිරිසිඳ දැනගැනීමේ ඥානය හා දේශනා කිරීමේ ඥානය යනුවෙනි. පිරිසිඳ දැනගැනීමේ ඥානය නම් ආර්ය ඵලයන් ප්‍රත්‍යක්ෂ ලෙස අවබෝධ කරගත් පෞද්ගලික වූ ඥානය යි. දේශනා කිරීමේ ඥානයෙන් අදහස් වන්නේ අන් පිරිස් අරමුණු

කරගනිමින් ඔවුන් කරුණාවෙන් ප්‍රඥාවට පත්කර ආර්ය ඵලයන් වෙත පමුණුවාලීම යි. පිරිසිඳ දැනගැනීමේ ඥානය ප්‍රවර්තනය වන්නක් මෙන්ම ප්‍රවර්තනය වූවක් නිරූපණය වේ. බුද්ධත්වය අවබෝධ කරගැනීම සඳහා බෝසතාණන් වහන්සේ අභිනිෂ්ක්‍රමණයේ සිට බුද්ධත්වය ලබාගැනීමේ මාර්ගය දක්වා පිරිසිඳ දැනගැනීමේ නුවණ උදා වෙමින් පැවතුණි. ඵලගන්නා මොහොතේ හෙවත් බුද්ධත්වයට පත්වන අවස්ථාවේදී ප්‍රතිවේධ ඥානය උදා විය. එසේත් නොමැති නම් බෝසතාණන් වහන්සේ තුසිත දෙව්ලොව වැඩසිටි කාලයේ පටන් බුද්ධත්වයට පත්වීම දක්වා හෝ දීපංකර බුදුරදුන්ගේ පාදමූලයේ මතු බුද්ධත්වය සඳහා විවරණ ලද මොහොතේ සිට බුද්ධත්වයට පත්වූ මොහොත දක්වා ප්‍රතිවේධ ඥානය පැවතුණා යැයි සැලකිය හැකි ය. ඒ අනුව උක්ත සියලු අවස්ථාවකදීම ප්‍රතිවේධ ඥානය පහළ වී ඇත. දේශනා ඥානය ප්‍රවර්තනය වෙමින් පවතින හා ප්‍රවර්තනය වූ යනුවෙන් දෙවැදෑරුම් ය. එහි පස්වග තවුසන් මුල්කරගනිමින් පැවැත්වූ පළමු ධර්ම දේශනාවේදී කොණ්ඩඤ්ඤ තාපසතුමා සෝතාපන්න අවස්ථාවට පත්වීම ප්‍රවර්තනය වෙමින් පවතින අවස්ථාව ලෙසත් හැඳින්වේ.

සූත්‍ර පිටකයට අමතරව විනය පිටකයෙහි ද ඇතැම් අවස්ථාවන්හි ධර්මය පොදුවේ හැඳින්වීම සඳහා ධම්මචක්ක යන ව්‍යවහාරය යොදා තිබේ. විශේෂයෙන් මහාවග්ගපාළියේ දැක්වෙන පරිදි බුදුරදුන් ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වීම සඳහා බරණැස් නුවරට වඩින අවස්ථාවේ ගයාවටත් බෝධි වෘක්ෂයටත් අතරමැද දී හමුවන උපක නම් ආජීවකයාට බුදුරදුන් දේශනා කළේ "මම දහම් සක පැවැත්වීම සඳහා කසීරට බරණැස් නුවර බලා යමි." යනුවෙනි. මෙහිදී උන්වහන්සේ උපක ආජීවකයාට ධර්මය දේශනා කිරීමට බරණැසට වැඩීම යන්න වෙනුවට "දම්සක පැවැත්වීමට වැඩීම" යන්න දේශනා කිරීමෙන් සමස්ත ධර්මය ම හැඳින්වීම සඳහා ධම්මචක්ක හෙවත් දහම්සක යන පදය යොදාගෙන ඇති බව වැටහේ. මජ්ඣිම නිකායාන්තර්ගත අනුපද සූත්‍රයෙහි වරක් තථාගතයන් වහන්සේ භික්ෂූන් අමතා සැරියුත් තෙරුන් පිළිබඳ ව කරන ලද විස්තරයකදී උන්වහන්සේ මැනවින් අනුත්තර වූ ධර්මචක්‍රය අනුප්‍රවර්තනය කරන ලද බවට ප්‍රශංසා කළ සේක. එහිදී සැරියුත් තෙරුන් අවබෝධ කරගත් ධර්මය බුද්ධ වචනය හෝ වෙනයම් වචනයකින් හඳුන්වා නොදී ධම්මචක්ක යන පදය ඒ සඳහා එක් කරගැනීම සුවිශේෂ වූවකි. බුද්ධ දේශනාව හැඳින්වීම සඳහා ධම්මචක්ක යන්න ගෞතම බුද්ධ ශාසනයේ පමණක් නො ව දීපංකර බුද්ධ සාසනයේ ද යොදාගෙන ඇත. දීපංකර බුදුරදුන් අභියස දී සුමේධ තාපසයන් "යම්සේ සම්බුදු කෙනෙකු දම්සක් පැවැත්වූවාහු ද මහාවීරයන් වහන්ස, එහෙයින් තෙපිදු දම්සක් පවත්වාලුව මැනව" යනුවෙන් කරන ලද ආයාචනයෙන් ඒ බව සනාථ වේ. මේ අනුව ධර්මය පිටක වශයෙන් බෙදී වෙන්ව යැමට ප්‍රථමයෙන් පොදුවේ ශ්‍රී මුඛ දේශනාව හැඳින්වීම සඳහා ධම්මචක්ක යන්න යොදාගෙන ඇති බව පැහැදිලි ය.

### අභිධම්ම-අභිවිනය

අභිධම්ම හා අභිවිනය යන පද දෙක ත්‍රිපිටකයේ යුගල වශයෙන් බොහෝ අවස්ථාවන්හි යෙදේ. එය තනි තනිව යෙදෙන අවස්ථා සොයාගැනීම අතිශයින් විරල වූවකි. කෙසේවතුදු ධර්මය පිටක වශයෙන් බෙදීයාමට මත්තෙන් අභිධම්ම හා අභිවිනය යන පද දෙකෙන් කවර නම් ධර්ම කොටසක් නියෝජනය වූයේ ද යන්න අධ්‍යයනය කිරීම වටී. මේ පිළිබඳ අදහස් දක්වන අටුවාචාරීන් වහන්සේලාගේ මතය නම් අභිධර්ම යන්නෙන් අභිධර්ම පිටකයත් අභිවිනය යන්නෙන් විනය පිටකයත් නියෝජනය වන බවයි. නමුත් මුල් සූත්‍ර දේශනාවන්වල මෙන්ම විනය පාඨයන්හි ඇතුළත් කරුණුවලට අනුව එම වචනද්වයෙන් සූත්‍ර හා විනය පිටකයන් පිළිබඳ කියවෙන බවක් අදහස් නො වේ. පශ්චාත්කාලීන සංගීතිකාරක තෙරවරුන්ගේ වර්ග කිරීමට අනුව ධර්මය (ධම්ම) සූත්‍ර

පිටකටයත් (අභිධම්ම) අභිධර්ම පිටකයටත් (විනය) විනය පිටකයටත් ඇතුළත් විය. නමුත් එම බෙදා දැක්වීමට අනුව අභිවිනය යන්න ඇතුළත් වූ පිටකයක් දැකගත නො හැකි ය. එම නිසා අභිධම්ම - අභිවිනය යන පදද්වය පිටකාර්ථයෙන් අර්ථ විවරණය කිරීම ප්‍රාමාණික වූවක් නොවේ. පෙළ ග්‍රන්ථයන්ට අමතරව අටුවාවන්හි ද අභිධම්ම හා අභිවිනය යන වචන දෙක විශේෂ අර්ථයන්හි යෙදී ඇත. ධම්මසංගණිප්පකරණට්ඨකථාවේ දී බුද්ධඝෝෂ තෙරුන් දක්වා තිබෙන්නේ 'ධම්ම' යන පදයට 'අභි' යන උපසර්ගය එක්වීමෙන් අතිරේක හෙවත් 'විශේෂ' යන අර්ථය ලැබෙන බවයි. මෙම විග්‍රහයම විනයට සම්බන්ධ කර බැලීමෙන් බුදුරදුන් විනය මුල්කරගනිමින් කළ විශේෂ දේශනා අභිවිනය වශයෙන් සැලකිය හැකි ය.

අභිධර්මය හා අභිවිනය පිළිබඳ ලබන ලද ඥානය බුදුරදුන් විශේෂ වශයෙන් අගය කළ බවක් අංගුත්තර නිකායේ බලුංකොපම සූත්‍රයේ දැක්වේ. උන්වහන්සේ එහිදී දේශනාකර ඇත්තේ "සසුනෙහි මහණදම් පුරන යම් අභිජාත පුරුෂයෙකු අභිධර්මයෙහි හා අභිවිනයෙහි ප්‍රශ්න මැනවින් විසඳා ඒ සඳහා පිළිතුරු ලබාදෙන බවයි." මීට සමාන අදහසක් දීඝනිකායාන්තර්ගත සංගීති සූත්‍රයේ ඉදිරිපත්ව ඇති අතර එහිදී උන්වහන්සේ ධර්මය කැමති වූ ධර්මය ප්‍රිය වූ භික්ෂුව අභිධර්මයේ හා අභිවිනයේ බහුල වූ ප්‍රමෝද ඇත්තෙක්ව වසන බව දේශනා කර ඇත. එමෙන්ම තථාගත දේශනාවට අනුව ලෝකයේ යථාස්වභාවය ඉතා මැනවින් වටහාගත් භික්ෂුව දුක මෙය යැයි යථාභූත ඥානයෙන් දකී ද, දුක්ඛ නිරෝධය යථාභූතයෙන් දකී ද, දුක්ඛ නිරෝධගාමිණී ප්‍රතිපදාව යථාභූතයෙන් දකී ද හෙතෙම ඒකාන්තයෙන් අභිධර්මයේ හා අභිවිනයේ ප්‍රශ්න විමසා පිළිතුරු ලබාදීමට සමත් අයෙක් බවට පත්වේ. මේ අනුව ධර්මය තුළ අභිධර්ම හා අභිවිනය යන වචනද්වය භාවිතව ඇත්තේ යම් ධර්ම කොටසක් වෙන්කොට දැක්වීමට නොව ධර්මය හා විනය පිළිබඳ යමෙකු තුළ පවත්නා ගැඹුරු වූ අවබෝධය මතුකර දැක්වීමට බව පැහැදිලි ය.

**බුද්ධ වචනය සම්බන්ධයෙන් පඤ්චසතිකක්ඛන්ධක මතය**

පඤ්චසතිකක්ඛන්ධක වාර්තාවට අනුව බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ඇවෑමෙන් මහා කාශ්‍යප මහතෙරුන්ගේ ප්‍රධානත්වයෙන් රජගහනුවර වේභාර පර්වත ප්‍රාන්තය ඇසුරු කරගත් සප්තපර්ණි ගුහාද්වාරයේ රැස්වූ මහරහතන් වහන්සේලා පන්සිය නමක් ප්‍රථම සංගායනාව පවත්වන ලදි. මෙම සංගායනාව හේතුවෙන් බොහෝ වටිනා ශාසනික සේවාවන් රැසක් සිදු වූ අතර බුද්ධ වචනය ධර්ම - විනය වශයෙන් බෙදී වෙන්ව යෑම ඉන් ප්‍රධාන තැනක් ගනී. බුදුරදුන් ධරමාන සමයෙහි තථාගත දේශනාව ධර්ම විනය වශයෙන් හා නවංගසත්ථුසාසන වශයෙන් හඳුන්වා තිබුණ ද කවර නම් කොටසක් ඒ ඒ අංගයන්ට අයත් ද යන්න නිශ්චිත ව දක්වා නොතිබුණි. නමුත් ප්‍රථම ධර්ම සංගායනාවේදී ඉතා පැහැදිලි ව බුද්ධ දේශනාව ධර්මය හා විනය වශයෙන් බෙදී වෙන් විය.

පඤ්චසතිකක්ඛන්ධක වාර්තාවට අනුව පළමුව සංගායනාවට බඳුන් වූයේ විනය යි. ඒ අනුව උපාලි මහ තෙරුන්ගේ ප්‍රධානත්වයෙන් විනය සංගායනා කරන ලදි. එහිදී බුදුරදුන් පඤ්ඤත්ති සික්ඛාපද සමූහ වශයෙන් දැක්වූ පාරාජිකා, සංඝාදිසේස, අනියත, නිස්සග්ගිය, පාචිත්තිය, පාටිදේසනීය, සේඛියා, අධිකරණසමථ යන උභය විභංගයම ප්‍රඥප්ති, අනු ප්‍රඥප්ති, ආපත්ති, අනාපත්ති සහිතව උපාලි තෙරහු විසින්ම විසඳූහ. සංගායනාවට බඳුන් වූ සමස්ත විනය ආදිබ්‍රහ්මචරියක සීලය හා ආභිසමාචරික සීලය වශයෙන් දෙවැදෑරුම් ය. ආදිබ්‍රහ්මචරියක සීලය නම් බුදුරදුන් "මහණෙනි මෙහි භික්ෂු තෙම ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුක්තව වෙසෙයි." යනුවෙන් වදාළ ප්‍රාතිමෝක්ෂය ඇතුළත් උභතෝ විභංගය යි. අභිසමාචරියක සීලයෙහි ඇතුළත් වන්නේ ආචාර්ය, උපාජ්ඣාය,

අන්තේවාසික, සද්ධිවිහාරික, ආගන්තුක වශයෙන් දැක්වූ වත් පිළිවෙත් ද පොහෝ පවුරුණු හා සිවුපසය කෙරෙහි පිළිපැදිය යුතු කප්පියාකප්ප සංසකර්මයන් ය. මේ අනුව සංගීතිකාරක තෙරුන් ප්‍රාතිමෝක්ෂය ඇතුළත් විනය උභතෝ විභංගය ලෙස ද අනුඥාත ශික්ෂාපද ඇතුළත් අභිවිනය බන්ධක ලෙස ද උභතෝ විභංගයේ හා බන්ධකයන්ගේ අර්ථ විවරණය කළ අභිවිනය පරිවාර ලෙස ද සංගායනා කරන ලදි.

විනයට පසුව සංගායනාවට බඳුන් වූයේ ධර්මය යි. එහිදී ධර්ම භාණ්ඩාගාරික වූ ආනන්ද මහතෙරුන් බ්‍රහ්මජාල සූත්‍රයේ පටන් එක් එක් සූත්‍රයන් හා එහි නිදානයන් දක්වමින් මහකසුප් හිමියන් ඉදිරියේ සියලු ධර්ම කොටස් ඉදිරිපත් කරන ලදි. මෙසේ ප්‍රථම සංගායනාවේදී ධර්මය හා විනය පමණක් සංගායනා වුවද එය ශාස්ත්‍රීය ලෝකයේ තවමත් විවාදාපන්න වූ කරුණකි. පඤ්චසතිකක්ඛන්‍ධක උද්දානයේ සඳහන් ඇතැම් කරුණු සැලකිල්ලට ගනිමින් අදහස් දක්වන උගතුන් කියා සිටින්නේ ධර්ම විනයට අමතරව අභිධර්මය නමින් තෙවන පිටකයක් සංගායනා වූ බවයි. තත් උද්දානයේ උපාලි තෙරුන්ගෙන් විනය පිටකය ද ආනන්ද තෙරුන්ගෙන් ධර්මය ද විචාරමින් පිටකත්‍රයක් සංගායනා කළ බවට දැක්වූ නමුත් එකී විවරණය තුළ පිටකත්‍රය කුමක් ද යන්න සංගීතිකාරක තෙරවරුන් නිශ්චිතව දක්වා නොමැත. මේ පිළිබඳ තවදුරටත් කරුණු දක්වන උගතුන්ගේ මතයට අනුව ප්‍රථම සංගායනාවේ දී අභිධර්මය ද සංගායනාවට බඳුන්ව එය සූත්‍රපිටකාගත ඛුද්දක නිකායට ඇතුළත් වී ඇත. මීට විරුද්ධව අදහස් දක්වන්නවුන් කියා සිටින්නේ පඤ්චසතිකක්ඛන්‍ධකයේ උද්දාන ගාථා පශ්චාත්කාලීනව එකතු කරන ලද්දක් නිසා ප්‍රථම සංගායනාවේදී ධර්මයට හා විනයට අමතරව අභිධර්මය නමින් තෙවන පිටකයක් සංගායනා වූ බව ප්‍රකාශ කිරීම අශාස්ත්‍රීය වූවක් බවයි. අටුවාචාරීන් වහන්සේලා දක්වන අන්දමට ත්‍රිපිටකයේ සඳහන් උද්දාන, පෙයයාල, වග්ග, නිපාත, සංයුත්ත, පණ්ණාසක, පිටක, නිකාය, ප්‍රකරණ ආදි සියල්ල සංගීතිකාරක තෙරවරුන් විසින්ම ව්‍යවස්ථාපනය කරන ලද්දකි. මෙම අටුවා මතයට අනුව පඤ්චසතිකක්ඛන්‍ධක උද්දානය සංගායනාවට පසුව එකතු වූයේ යැයි දක්වමින් එහි සඳහන් කරුණු බැහැර කිරීම ද කළ හැක්කක් නොවේ. කරුණු කෙසේවෙතත් පළමු සංගායනාවේදී අභිධර්මය පිටකයක් වශයෙන් සංගායනාවට බඳුන් වූයේ ද යන්න නිශ්චිතව ප්‍රකාශ කිරීමට ශාස්ත්‍රීය ලෝකය තවමත් අපොහොසත් වී ඇත.

**බුද්ධ වචනය සම්බන්ධයෙන් සත්තසතිකක්ඛන්ධක මතය**

ප්‍රථම සංගායනාවේදී ධර්මය සූත්‍ර හා විනය වශයෙන් පමණක් බෙදීගිය බව අප ඉහත සඳහන් කළෙමු. මෙම බෙදීයෑම දෙවන සංගායනාව වන තෙක්ම පැවති බවට කරුණු සනාථ කරගැනීමට සත්තසතිකක්ඛන්ධක වාර්තාව ප්‍රමාණවත් ය. එහි කිසිදු අවස්ථාවක අභිධර්ම පිටකයක් පිළිබඳ සඳහන් නොවේ. සංගායනාව සඳහා හේතු වූ වජ්ජිපුත්තක භික්ෂූන්ගේ දස වස්තුව අවිනයවාදී බව දැනගත් රේවත මහ තෙරුන් සෙසු භික්ෂූන්ට කියා සිටින්නේ "අධර්මය බැබළීමට ද ධර්මය බැහැර කරනු ලැබීමට ද අවිනය බැබළීමට ද විනය බැහැර කරනු ලැබීමට ද පෙර අධර්මවාදීන් බලවත් වීමට ද ධර්මවාදීන් දුබලවීමට ද පෙර සංගායනාවක් කළ යුතු බවයි." මෙම ප්‍රකාශයට අනුව රේවත තෙරුන් ධර්මයට හා විනයට පරිබාහිර වූ තෙවන පිටකයක් පිළිබඳ කිසිදු සඳහනක් කර නොමැත. එමෙන්ම දස වස්තුව විනය විරෝධී බවට සාළ්හ මහ තෙරුන් වහන්සේ නිගමනයකට පැමිණියේ ධර්මයත් විනයත් ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් අනතුරුව විනා අභිධර්මය මෙනෙහි කිරීමෙන් නො වේ. දෙවන සංගායනාව සිදු කරන සමය වන විට සසුන තුළ වැඩසිටි සංඝස්ථවිරයන් වහන්සේ වූයේ සබ්බකාමී මහරහතන් වහන්සේ ය.

උන්වහන්සේ වෙත එළඹී ආයුෂ්මත් සම්භූත තෙරුන් විමසන්නේ "ඇවැත්නි, තොප විසින් ද උපාධ්‍යායයන් වහන්සේ වෙත බොහෝ ධර්මය ද විනය ද පුහුණු කරන ලද්දේ ය. ඇවැත්නි, ධර්මය ද විනය ද ප්‍රත්‍යවේක්ෂා කරන තොපට කෙසේ අදහස් වේ ද? ප්‍රාචීන භික්ෂූහු හෝ පාවෙය්‍යක භික්ෂූහු හෝ කවරෙක් ධර්මවාදීහූ වෙත් ද" යනුවෙනි. මෙම සංවාදයෙන් ද සබ්බකාමී මහතෙරුන් ධර්මයෙහි හා විනයෙහි පමණක් ප්‍රාමාණික දැනුමක් ලබා සිට ඇති බව පැහැදිලි ය.

ධර්මය හා විනය යන වචනද්වයට අමතරව සත්තසතිකක්ඛන්ධක වාර්තාවේ හමුවන සුවිශේෂ වචනයකි 'මාතිකාධර' යන්න. රේවත මහ තෙරුන් වහන්සේ පිළිබඳ කරන ලද විස්තරයේදී උන්වහන්සේ ධර්මධර විනයධර හා මාතිකාධර යන තෙයංශයෙන්ම ව්‍යක්ත, නුවණැති භික්ෂුවක් ලෙස හඳුන්වා ඇත. මෙහි දැක්වෙන ධර්මධර යන්නෙන් සූත්‍ර පිළිබඳ විශේෂ දැනුමක් ඇති භික්ෂූන් නියෝජනය වේ. ඒ අනුව විනය පිළිබඳ විශේෂ දැනුමක් ලැබූ භික්ෂූන් විනයධර වන්නේ නම් මාතිකාධර යනු කවර නම් ධර්ම කොටසක විශේෂ දැනුමක් ලබන ලද්දෙක් ද යන්න පිරික්සිය යුතු ය. ඇතැම් ධර්ම කරුණු ඉදිරිපත් කිරීමේදී බුදුරදුන් පවා මාතෘකා වශයෙන් පමණක් හෝ සාරාංශ වශයෙන් පමණක් දේශනා කර ඇත. මජ්ඣිම නිකායාන්තර්ගත මහා සකුළුදායී සූත්‍රයත්, ඒකක, දුක, තික, චතුක්ක ආදි වශයෙන් නිපාත ක්‍රමයට සංග්‍රහ කර ඇති දීඝ නිකායාන්තර්ගත සංගීති සූත්‍රයත් ධාතු කුසල, ආයතන කුසල, පටිච්චසමුප්පාද වශයෙන් ලේඛන ස්වරූපයෙන් දක්වා ඇති මජ්ඣිම නිකායාගත බහුධාතුක සූත්‍රයත් ඒ සඳහා නිදසුන් ය. මෙසේ මාතෘකා ලෙස කෙටියෙන් දක්වා ඇති සූත්‍ර දේශනා සියල්ල එක හා සමාන අන්දමින් අවබෝධ කරගැනීම දුෂ්කර හෙයින් ඇති වූ ගැටලු තැන් මගහරවා ගැනීම සඳහා ඇතැම් භික්ෂූන් සසුනෙහි වැඩ සිටි බහුශ්‍රැත මහතෙරුන් වහන්සේලා වෙතට ගොස් එම දුරවබෝධ තැන් නිරාකරණය කරගත්හ. මෙසේ ධර්මයේ ගැඹුරු තැන් සරල ලෙස විස්තර කර දීමට සමත් භික්ෂූන් වහන්සේලා හැඳින්වීම සඳහා මාතිකාධර යන වචනය භාවිත වූවා හැරෙන්නට ඉන් ධර්මයේ එක් කොටසක් හෝ පිටකයක් අදහස් නොවේ. සත්තසතිකක්ඛන්ධක වාර්තාවේ ඇතුළත් උක්ත කරුණු සියල්ල සලකා බැලීමෙන් දෙවන සංගායනාව වන තෙක් ධර්මය බෙදී පැවතියේ සූත්‍ර හා විනය වශයෙන් පමණක් බව ඒ අනුව පැහැදිලි ය.

### නවංගසත්ථුසාසන වර්ගීකරණය

බුද්ධ වචනය සම්බන්ධයෙන් කරන ලද වර්ගීකරණයන් අතුරින් ධම්ම විනය යන්නට පසුව හමු වන ඉපැරණිම බෙදා දැක්වීම නවංගසත්ථුසාසනය යි. මෙම නවංගය පිළිබඳ නම් ලැයිස්තුව මජ්ඣිම නිකායේ මූල පණ්ණාසකයට අයත් අලගද්දූපම සූත්‍රයෙහි ද අංගුත්තර නිකායේ තැන් කිහිපයක ද විනය පිටකයේ පාරාජිකා පාළියට අයත් වේරඤ්ජා භාණ්ඩයේ ද සඳහන්ව ඇත. මෙසේ මෙම මූලාශ්‍රයන්හි නාමික වශයෙන් අංග නවයක් දක්වා තිබුණ ද ඒ ඒ කොටසට කවර නම් ධර්මයක් ඇතුළත් ද යන්න සඳහන් වී ඇති බවක් නොපෙනේ. මීට අමතර ව ලක්දිව රචනා වූ ඉපැරණි ම ග්‍රන්ථයක් වන දීපවංසයෙහි මෙම නම් ලැයිස්තුව සඳහන් කර තිබුණ ද එහි ද ඒ ඒ අංගයන්ට අයත් ධර්ම කොටස් දක්වා නැත. මෙසේ පෙළ ග්‍රන්ථයන්හි නාමික වශයෙන් හඳුන්වා තිබූ නවංගසත්ථුසාසනය පිළිබඳ පූර්ණ වර්ග කිරීමක් අපට හමුවන්නේ අටුවා යුගයේදී ය. අටුවාකරණයෙහි සුවිශාල මෙහෙයක් කළ බුද්ධඝෝෂ තෙරුන් සමන්තපාසාදිකා, අත්ථසාලිනී, සුමංගලවිලාසිනී යන අටුවා කිහිපයකම ඒ ඒ අංගයට අයත් ධර්ම කොටස් වෙන වෙනම දක්වා තිබේ.

මෙසේ බුද්ධඝෝෂ තෙරුන් මුල් බුද්ධ දේශනාවන්හි සඳහන් නොවන වර්ගීකරණයක් කවර නම් පදනමක් මුල් කරගනිමින් සිදු කළා ද යන්න අධ්‍යයනය කිරීම වටී. ඒ අනුව සුමංගලවිලාසිනියෙහි

ධර්මය නවංගසත්ථුසාසනය යටතේ හඳුන්වා ඒ ඒ කොටසට අයත් ධර්ම කරුණු වර්ග කර දක්වා ඇත්තේ මේ අයුරිනි.

i. සුත්තං - උභතො විභංග, නිද්දේස, ඛන්ධක, පරිවාර ද සුත්ත නිපාතයේ මංගල, රතන, තුවටක, නාලක යන සූත්‍ර නාමය සහිත සූත්‍ර ද අන්‍ය වූ සූත්‍ර නාමය ඇති බුද්ධ වචනයක් වේ ද ඒ සියල්ල සුත්ත නම් වේ.

ii. ගෙය්‍ය - ගාථා සහිත සියලු සූත්‍ර ගෙය්‍ය නමින් හැඳින්වේ. විශේෂයෙන් සංයුත්ත නිකායාන්තර්ගත සගාථක වර්ගය මේ සඳහා ඇතුළත් ය.

iii. වෙය්‍යාකරණ - සියලු අභිධර්මයත්, නිර්ගාථක සූත්‍රත් අනෙක් අංග තුළ සංග්‍රහ නොවූ යම් බුද්ධ වචනයක් වේ නම් ඒ සියල්ල වෙය්‍යාකරණයට අයත් ය.

iv. ගාථා - ධම්මපද, ථේරගාථා, ථෙරීගාථා හා සුත්තනිපාතයේ රතන සුත්ත නාමික දේශනා ගාථා නම් වේ.

v. උදාන - සෝමනස්ස ඤාණමධික ගාථාවන්ගෙන් යුත් අසූ දෙකක් සූත්‍රාන්ත උදාන නම් වේ.

vi. ඉතිවුත්තක - "බුදුරජාණන් වහන්සේ මෙය මෙසේ දේශනා කරන ලදි." යනුවෙන් සඳහන් වන සූත්‍රාන්ත 110ක් මෙයට ඇතුළත් ය.

vii. ජාතක - අපණ්ණක ආදී කොට ඇති 550ක් වූ ජාතක, ජාතක නම් වේ.

viii. අබ්භූතධම්ම - "මහණෙනි, ආනන්ද තෙරුන් කෙරෙහි මෙබඳු ආශ්චර්යමත් අද්භූත ධර්ම හතරක් වෙයි." මෙසේ ආශ්චර්යය අද්භූත කරුණු ඇතුළත් සූත්‍රාන්ත අබ්භූතධම්ම යි.

ix. වේදල්ල - චුල්ලවේදල්ල, මහාවේදල්ල, සම්මා දිට්ඨි, සක්කපඤ්හ, සංඛාර භාජනීය, මහා පුණ්ණම ආදි ඤාණය හා සතුට උපදවන දේශනා වේදල්ල කොටසට අයත් ය.

මෙසේ බුද්ධඝෝෂ තෙරුන් සමස්ත බුද්ධ වචනය ම ඒ ඒ අංගයට ඇතුළත් කර තිබුණ ද එහි යම් යම් පරස්පර විරෝධී සංඛ්‍යාත්මක දත්ත අඩංගු බවක් පෙනේ. විශේෂයෙන් උදාන පිළිබඳ කරන ලද සඳහනේ උදාන අසූ දෙකක් දක්වා තිබුණ ද උදාන පාළියේ හමු වන්නේ උදාන අසූවක් පමණි. ඉතිවුත්තක වර්ගයට අයත් සූත්‍ර එකසිය දහයක් ඇති බවට අටුවා ඇදුරන් පැවසුව ද ඉතිවුත්තක පාළියේ සූත්‍රාන්ත එකසිය දොළහක් හමු වේ. ජාතක පන්සිය පනහක් ඇතැයි බුද්ධඝෝෂ තෙරුන් සඳහන් කළ ද ජාතක පොතෙහි ඇතුළත් වන්නේ ජාතක පන්සිය හතළිස් හතක් පමණි. මෙම පරස්පර අදහස් කවර නම් හේතුවක් නිසා ඇති වූවා ද යන්න නිශ්චිතව කිව නොහැකි වුවත් සංඛ්‍යාත්මක වශයෙන් කරුණු ඉදිරිපත් කිරීමෙන් ඇති වූ දෝෂයකැයි සැලකිය හැකි ය.

නවංගසත්ථුසාසනය සඳහා අටුවාචාර්යයන් වහන්සේලා සමස්ත ත්‍රිපිටකය ඇතුළත් කිරීමට උත්සාහ ගෙන ඇත්තේ බුද්ධ වචනය යන්නෙන් පිටකත්‍රයම අදහස් වනවා යැයි සැලකූ හෙයිනි. නමුත් එසේ සිදු කිරීමට යාමෙන් ඇති වූ ගැටලු බොහෝ ය. බුදුරදුන් සුත්ත, ගෙය්‍ය ආදී වශයෙන් ධර්මය දේශනා කර තිබූ නමුත් ඒ වන විට ධර්මය පිටක වශයෙන් බෙදී තිබුණේ නැත. එබැවින් තෙවන සංගායනාවෙන් පසුව සම්පූර්ණත්වයට පත් අභිධර්ම පිටකය වැනි කොටස් නවංගසත්ථුසාසනයට ඇතුළත් කිරීමට බුද්ධඝෝෂ තෙරුන් උත්සාහ ගන්නේ මන්දැයි සලකා බැලිය යුතු බව පෙනේ.

ත්‍රිපිටකය යනු සියවස් ගණනාවක් පුරා සංවර්ධනයට පත්වෙමින් පැවත එන ලද්දක් බව අප ප්‍රථමයෙන් වටහාගත යුතු ය. අභිධර්මය පූර්ණ පිටකයක් වශයෙන්

සංවර්ධනය වූයේ තෙවන සංගායනාවෙන් පසුව වීමත් විනය පිටකය උභතො විභංග, ඛන්ධක, පරිවාර යන කොටස්වලට බෙදීයාම සිදුවූයේ බුද්ධ පරිනිර්වාණයෙන් බොහෝ කලක් ගතවීමෙන් වීමත් මේ සඳහා කදිම නිදසුන් ය. එසේ වී නමුත් බුද්ධඝෝෂ තෙරුන් අභිධර්ම පිටකය අයත් කරන්නේ වෙය්‍යාකරණ අංගයට ය. බුදුරදුන් ධරමාන සමයේ දක්වන ලද වෙය්‍යාකරණ අංගයට මෙසේ අභිධර්මය එක් කිරීම යුක්ති සහගත වූවක් වේ. එමෙන්ම අභිධර්ම පිටකයට අමතරව වෙය්‍යාකරණ අංගය සඳහා ගාථා නැති (නිග්ගාථකං සුත්තං) සූත්‍රත් අනෙකුත් අංග අට සඳහා ඇතුළත් නොවූ ධර්ම කොටස් ඇතුළත් කිරීමත් නිසා අනෙකුත් අංග අට සඳහා ඇතුළත් කළ හැකි ධර්ම කොටස් පවතින්නේ අල්ප වශයෙනි. මේ සඳහා විශේෂයෙන් බලපා ඇත්තේ බුද්ධඝෝෂ තෙරුන් බෙදා දැක්වූ ධර්ම කොටස්හි පරස්පර විරෝධීබවත් ඇති හෙයිනි. මෙවැනි ගැටලුවක් සුත්ත හා වෙය්‍යාකරණ අංගයන් අතර ද පවතී. ධම්මචක්ක, බ්‍රහ්මජාල වැනි සූත්‍ර අටුවාව තුළ වෙය්‍යාකරණ අංගයට ඇතුළත් කර තිබුණ ද සුත්ත ලෙස නම් වී ඇති සියලු සූත්‍ර සුත්ත අංගයට ඇතුළත් කළ පසු ධම්මචක්කප්පවත්තන සූත්‍රය ද ඒ සඳහා අයත් විය යුතු ය. මෙසේ එක් අංගයකට අන්තර්ගත කළ ධර්ම කොටස් තවත් අංගයකට අයත් වීමෙන් බුද්ධඝෝෂ තෙරුන්ගේ ධර්ම වර්ගීකරණය ප්‍රශ්නසහගත බව පෙනේ. එහෙයින් නවංගසත්ථුසාසනයට බුද්ධ වචනය ඇතුළත් කිරීමට අටුවා ඇදුරන් ගත් උත්සාහය ගන්නේ මන්දැයි වැඩිදුරටත් ගැඹුරින් අධ්‍යයනය කළ යුතු ය.

**සමෝධානය**

තථාගතයන් වහන්සේ බරණැස ඉසිපතනයෙහි දේශනා කරන ලද ප්‍රථම ධර්ම දේශනාවේ සිට අනුපදිසේස පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑම දක්වා පන්සාළිස් වසක් පුරා දේශනා කරන ලද ධර්ම අද වන විට විවිධ විභජනයන්ට බඳුන්ව ඇති බව පැහැදිලි ය. බුදුරදුන් ධරමාන සමයේ ධර්මය හඳුන්වාදීම සඳහා ධම්ම, ධම්ම විනය, ධම්මචක්ක ආදි නාමයන් යොදා ගත්ත ද ඉන් නිශ්චිත වශයෙන් ධර්මයේ කවර නම් කොටස් ප්‍රකාශවන්නේද යන්න පෙන්වාදී නොමැත. ඒවා ධර්මය හඳුන්වාදීම සඳහා යොදා ගත් පොදු නාමයන් පමණි. නමුත් බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ඇවෑමෙන් කරන ලද ප්‍රථම සංගායනාවේදී මුල් වරට ශ්‍රීමුඛ දේශනාව ධර්මය හා විනය වශයෙන් පැහැදිලිව විභජනය වූ අතර එය තෙවන සංගායනාව වනවිට පිටකත්‍රයක් බවට පත්වූයේ අභිධර්මය නමින් නවමු පිටකයක් එක්වීමෙනි. කෙසේ වෙතත් ධර්මය වර්ගීකරණය කිරීමේදී බුද්ධඝෝස ආදී තෙරවරුන් අතින් යම් යම් දුබලතාවයන් සිදුවී ඇති නමුත් මුඛ පරම්පරාගතව ධර්මය ඉදිරියට පවත්වාගෙන ඒම සඳහා සංගීතිකාරක තෙරවරුන් ගත් සුවිශේෂ උපක්‍රමයක් ලෙස ධර්ම වර්ගීකරණය හඳුන්වාදිය හැකි ය.

**මූලාශ්‍රය**


"අධිගතො ඛො මයා ධම්මො ගම්භීරො දුද්දසො දුරනුබොධො සන්තො පණීතො අතක්කාවචරො..." *මජ්ඣිම නිකාය II*, (2005). පාසරාසි සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*අංගුත්තර නිකාය.* (2005). බණ්ඩුර වග්ගය, 9 සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

"ධම්මචක්කං පවත්තෙතුං ගච්ඡාමි කාසිනං පුරං" විනය පිටකය, (2005). *මහාවග්ගපාළි.* 6 බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

"ඉධ භික්ඛවෙ එකච්චෙ මොඝ පුරිසා ධම්මං පරියාපුණන්ති. සුත්තං, ගෙය්‍යං වෙය්‍යාකරණං..." *මජ්ඣිම නිකාය I,* (2005). අලගද්දූපම සූත්‍රය, දෙහිවල: බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*අංගුත්තර නිකාය.* (2005). බණ්ඩුර වග්ගය, 9 සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*ධම්මපදපාළිය.* (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

පියරතන හිමි, බද්දේගම, (සංස්). (2012), *සමන්තපාසාදිකාව.* බාහිර නිදානය, බෞද්ධ දෙහිවලඃ සංස්කෘතික මධ්‍යස්ථානය.

ධම්මතිලක හිමි, පැලැන්වත්තේ, (2003). *ධම්ම සංකල්පයේ දේශපාලන ආර්ථික සමාජ භාවිතය.* මරදානඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*Pali English Dictionary.* (2004). Oxford: The Pali Text Society.

DHAMMA: lite the 'bearer' constitution, (1966), (or nature of a thing) no law (jus), doctrine; justice, righteoshess, quality; thing, object of mind (5 āyathana) phenomenon, In all these meanings the word "DHAMMA" is to be meet with in the text fn!oaO Yíofldalh" ඤාණතිලෝක තෙරුන්. (පරි). පී. ඩී. ප්‍රේමසිරි. මහනුවරඃ බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය.

ජෝන් රෝස් කාටර්. (1985). *ධම්ම.* (පරි), ඩබ්. එස්. කරුණාතිලක, මරදානඃ ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

"ඉධ භික්ඛු ධම්මං පරියාපුණන්ති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණන්ති ආදිසු පරියත්තියං..." *පපඤ්චසූදනී I.* (1959). කොළඹඃ හේවාවිතාරණ මුද්‍රණය.